# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2178/4 - 2020 ජුනි මස 01 වැනි සඳුදා - 2020.06.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

### අංක 03/2020 දරන සුරාබදු නිවේදනය

ස්ටිකර සහ ස්ටිකර කළමණාකරණ පද්ධතිය

සංශෝධිත (52 වන අධිකාරිය වන) සුරාබදු ආඥාපනතේ 8 වන සහ 30 වන වගන්තිය සමග කියවිය යුතු 32 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, අංක 2164/72 දරන මාර්තු 01, 2020 දිනැති *ගැසට් පත්‍රය* මගින් අවසන් වරට සංශෝධනය කරන ලද පරිදි, අංක 2128/30 දරන 2019.06.20 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 04/2019 දරන සුරාබදු නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද රීති, පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

1. 3 වන රීතියේ,

   (අ) පළමු අතුරු විධානයේ (ii) වන ඡේදයේ සඳහන් "සැප්තැම්බර් 01, 2020" යන වචන හා ඉලක්කම් වෙනුවට "දෙසැම්බර් 31, 2020" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීම, සහ

   (ආ) දෙවන අතුරුවිධානයේ (ii) වන ඡේදයේ සඳහන් "සැප්තැම්බර් 01, 2020" යන වචන හා ඉලක්කම් වෙනුවට "දෙසැම්බර් 31, 2020" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීම.

2. 13 වන රීතියෙහි සඳහන් "දින තුන්සිය හතලිස් හතක් (347)" යන වචන හා ඉලක්කම් වෙනුවට "දින පන්සිය හැට එකක් (561)" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීම.

**මහින්ද රාජපක්ෂ,**
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 ජුනි මස 01 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

07 - 121

1A - PG 5014 - 592 - (2020/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*